**ශීර්ෂය - 22 පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 26 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 15 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදි.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අනුරූපි වී නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **ඡේදයට යොමුව** |
| --- | --- |
| (i) සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදු කිරීම | 1.6.1 (ඈ) |
| (ii) දේපල පිරියත හා උපකරණ | 1.6.1(අ) |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2021 නොවැම්බර් 26 දින නිකුත් කල රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්,එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ගෝපදේශයෙහි 3.1 ඡේදය ප්‍රකාරව 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සඳහන් සංඛ්‍යා, භාණ්ඩාගාරයේ පොත්වල සඳහන් සංඛ්‍යා පදනම් කරගෙන පිළියෙල කළ යුතු නමුත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවලට වඩා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් දේපල පිරියත හා උපකරණ ආරම්භක ශේෂය රු.392,925 ක් අඩුවෙන්ද, වර්ෂයේ මිලදී ගැනීම් රු.75,519 ක් වැඩියෙන්ද, අපහරණයන් රු.3,500 ක් අඩුවෙන්ද සටහන් කර තිබුණි. | 2021 වර්ෂය තුල, ප්‍රථම වරට සිගාස් පද්ධතිය සඳහා වත්කම් ඇතුලත් කරන ලද අතර 2021 වර්ෂයේ මිල දී ගැනීම් 2021.12.31 දිනට අවසාන ශේෂය ලෙස ඇතුලත් කර ඇත. එම නිසා වෙනස්කම් ඇති වී ඇත. | මූල්‍ය ප්‍රකාශනවල හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවල ඇතුලත් තොරතුරු සැසඳී තිබිය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මාර්ගෝපදේශයෙහි 06 ඡේදය ප්‍රකාරව ඒසීඒ-6 ආකෘතිය සඳහා මූල්‍ය නොවන වත්කම් පිළිබද ප්‍රකාශය - SA - 82 භාවිතා කළ යුතුව තිබුණු නමුත් ඒ වෙනුවට ඒසීඒ - 6 ආකෘතිය සඳහා වත්කම් ලැයිස්තුවක් ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ආකෘති පත්‍ර වල, ඒසීඒ-6 ආකෘතියේ දක්වා තිබූ පරිදි සිගාස් වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය අමුණා ඇත. | අදාල මාර්ගෝපදේශයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි වාර්තා කිරීමේ පදනම යටතේ ඡේද අංක 07 හි “ 2021 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදු කරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදු කර ඇත.”යනුවෙන් සඳහන්ව පසුගිය වසරෙහි සංඛ්‍යා වෙනස් කර තිබුණු නමුත් ඊට අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා සංඛ්‍යා වල අදාල ගැලපුම් සිදු කර තිබුණ ද, එම ගැලපුම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට අතපසු වී ඇත. | මූල්‍ය ප්‍රකශනවල හෙළිදරව් කිරීම් කළ යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) පුනරාවර්තන වියදම්**

-----------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු. 79,780 ක් වූ පුවත් පත් වියදම තුල ඉදිරි | 2022 වර්ෂයට පුවත්පත් සැපයීම සඳහා පෙර වර්ෂයේ | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කාල |

| | | |
|---|---|---|
| වර්ෂය සඳහා මිලදී ගැනීමට අපේක්ෂිත පුවත්පත් සඳහා ගෙවන ලද රු.49,690 ක් ඇතුලත්ව තිබුණු අතර එම අගය සමාලෝචිත වර්ෂයේ වියදමට ඇතුලත් කර තිබීම හේතුවෙන් වර්ෂයේ මුළු පුනරාවර්තන වියදම සහ මුළු වියදම රු.49,690 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගෙවීම් සිදු කළ යුතු බැවින් 2021 වර්ෂයේ දෙසැම්බර් මස දායක මුදල් ගෙවා ඇත.එම නිසා ඔබගේ ඡේදයේ සඳහන් වෙනස ඇති වී ඇති බව දන්වා සිටිමි. | පරිච්ඡේදයට අදාල තොරතුරු ඇතුලත් කළ යුතුය. |

(ආ) **මූලධන වියදම්**

-----------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල රු.75,519 ක වත්කම් අත්පත් කර ගැනීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත්කර ගැනීම් යටතේ ඇතුලත් කර තිබුණු නමුත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනේ SA - 82 හි මිලදී ගැනීම් යටතේ ඇතුලත් කර නොතිබුණි. | 2021 වර්ෂය තුල ප්‍රථම වරට සිගාස් පද්ධතියට වත්කම් ඇතුලත් කරන ලද බැවින් 2021 වර්ෂයේ මිලදී ගැනීම් 2021.12.31 දිනට අවසාන ශේෂය ලෙස ඇතුලත් කර ඇත. එම නිසා එය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත වල මිල දී ගැනීම් යටතේ ඇතුලත් වී නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවල ඇතුලත් තොරතුරු සැසඳී තිබිය යුතුය. |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ණය ශේෂය රු. 3,436,555 ක් වූ අතර එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.3,399,798 ක් වූයෙන් ඒ අතර රු.36,757 ක වෙනසක් විය. එම වෙනස නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී කටයුතු කර නොතිබුණි. | එම වෙනස නිවැරදි කිරීම සඳහා, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් විමසා ඇති අතර, මේ වන විට ඒ සඳහා කටයුතු කරමින් පවතී | ගිණුම් අතර වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

**(අ) ප්‍රතිපාදන ඉතිරිවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මුදල් රෙගුලාසි 50 ට අනුව නිවැරදි වියදම් තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු | 2021 වර්ෂය තුල දී කාර්යාල ගොඩනැගිල්ලේ සිදු කරන ලද සුළු අළුත්වැඩියාවන් | වියදම් නිවැරදිව තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු |

| | | | |
|---|---|---|---|
| | පිළියෙල කළ යුතු වුවත්, ඒ අනුව ක්‍රියා නොකිරීම නිසා වැය විෂයය 02 ක් සඳහා වෙන්කර තිබුණු රු.300,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි. | ගොඩනැඟිලි හිමිකරු විසින් සිදු කළ බැවින් වැය විෂය 1303 යටතේ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වූ අතර, කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරීන් පුහුණු වැඩමුළු සඳහා සහභාගී නොවීම නිසා වැය විෂය 2401 යටතේ වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී ඇත. | පිළියෙල කළ යුතුය. |
| **(ii)** | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2021 නොවැම්බර් 26 දින නිකුත් කළ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 දරන චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව එක් එක් වැය විෂය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම් අතර වෙනස, වැය විෂයයේ ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් සියයට 5 හෝ රු.10,000 යන දෙකෙන් කවර හෝ වැඩි මුදලකට වඩා වැඩි වන්නේ නම්, එම වෙනසට හේතු ඒසීඒ-2(ii) ආකෘතියෙහි දැක්විය යුතු වුවත්, වැය විෂයයන් 03 ක එකතුව රු.2,996,183 ක ඉතිරිවීම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂය දක්වාම වැටුප් හා දීමනා සඳහා වූ වැය විෂයන්වල ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා හේතු දක්වා නොමැති බැවින් 2021 වර්ෂය සඳහා ද එම වැය විෂයන්වල ඉතිරිවීම් සඳහා හේතු දක්වා නොමැත. ඉදිරි වර්ෂයන් සඳහා ගිණුම් සකස් කිරීමේ දී අදාල උපදෙස් පරිදි සකස් කිරීමට කටයුතු යොදමි. | අදාල මාර්ගෝපදේශයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | මූලධන වැය විෂයයක හා පුනරාවර්තන වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණ එකතුව රු.16,655,000 ක ප්‍රතිපාදනයෙන් රු.4,084,881 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් අදාල වැය විෂයයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 සිට සියයට 90 දක්වා පරාසයක විය. | 2021 වර්ෂය තුල කාර්යාලයේ නිලධාරිනියන් කිහිපදෙනකු ස්ථාන මාරු වී යාම, වැටුප් රහිත හා අඩ වැටුප් සහිත නිවාඩු ලබා ගැනීම නිසා වැය විෂයය 1001(11) හි හා වැය විෂයය 1003 හි ප්‍රතිපාදන ඉතිරි වූ අතර, රට තුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් වර්ෂය තුල අපේක්ෂිත වියදම් සැලකිය යුතු ලෙස අඩු වීම අනෙකුත් පුනරාවර්තන වැය විෂයන්වල ප්‍රතිපාදන ඉතිරිවීමට මූලිකවම බලපා ඇත. මූලධන වියදම් සීමා කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලද වාචික උපදෙස් අනුව අපේක්ෂිත මිලදී ගැනීම් අත්හැර දැමීම නිසා වැය විෂය 2102 යටතේ ප්‍රතිපාදන ඉතිරි විය. | වියදම් නිවැරදිව තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| **(iv)** | වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ මූලධන වියදම රු.1,357,000 ක් වූ අතර ප්‍රතිපාදන ලැබීම් රු.550,000 ක් විය. වර්ෂයේ තථ්‍ය වියදම රු.75,519 ක් වූ අතර එය ඇස්තමේන්තුගත මුදලෙන් සියයට 5.6 ක් වී තිබුණු අතර ප්‍රතිපාදන උපයෝජනය ප්‍රතිපාදන ලැබීම්වලින් සියයට 13.7 ක් විය. | මූලධන වියදම් සීමා කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද වාචික උපදෙස් අනුව අපේක්ෂිත මිලදී ගැනීම් සීමා කරන ලදී. | වියදම් නිවැරදිව තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 සැලැසුම් කිරීම

-----------------

#### 3.1.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------------- | --------------- |
| (අ) | ප්‍රසම්පාදන සැලැස්මේ අපේක්ෂිත කාලසීමාව දැක්වීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදනය ආරම්භයේ සිට අවසන් වන තෙක් ක්‍රමානුකූලව කාල පරාසය දැක්විය යුතු වුවද, ඊට පටහැනිව 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලෙස මුළු කාලසීමාවම ප්‍රසම්පාදන සැලැස්මේ සටහන් කර තිබුණු අතර කාල පරිච්ජේදයන් වෙන් වෙන්ව දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේ දී අදාල අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කිරීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශයට අනුව, පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කර එය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කළ යුතු වුවත්, කාර්යාලයේ පරිගණක ජාලගත කිරීම් ප්‍රසම්පාදන කටයුත්ත සැලැස්මට ඇතුලත් කර තිබුණද, එහි ඇස්තමේන්තුගත පිරිවැය සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | කාර්යාලයේ පරිගණක ජාලගත කිරීම සඳහා මිල ඇස්තමේන්තුවක් ලබා ගැනීමට අදාල කාර්ය පිළිබඳ දැනුම ඇති තාක්ෂණික නිලධාරියෙකු නොසිටි නිසා ඇස්තමේන්තු ගත පිරිවැය සැලසුමේ ඇතුලත් කිරීමට නොහැකි විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 මාර්ගෝපදේශයට අනුව කටයුතු කළ යුතුය. |

**3.2 කාර්යසාධනය**

----------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------------- | --------------------- | ----------- |
| දින වනවිට පරීක්ෂණ 01 ජනවාරි 2021 පැවැත්වීමට හා වාර්තා කිරීමට නියමිත පසුගිය ,ක් ද 828 වර්ෂයෙන් ඉතිරි වී තිබූ පැමිණිලි සමාලෝචිත වර්ෂය තුල ආයතනයට ලද පැමිණිලි ක් ද ලෙස වර්ෂය තුළ 1,274පරීක්ෂා කිරීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව ක් 2,102 එය.විය◌න් වර්ෂය තුල පැමිණිලි ක් 1174 සම්බන්ධයෙන් කටයතු සිදු කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැමිණිලි ක් පරීක්ෂණ පැවැත්වීමට හා වාර්තා 928 කිරීමටතව දුරටත් ඉතිරිව තිබුණි . | එහි දක්වා ඇති සංඛ්‍යා ලේඛන නිවැරදි වේ. | පැමිණිලි කඩිනමින් විසදීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 11.1 ජේදයේ අනු අංක 06 ප්‍රකාරව යාවත්කාලීනව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබූ අතර මේ වනවිටත් එම කටයුතු අවසන් කර විගණකාධිපති වෙත වාර්තා යොමු කර නොතිබුණි. | 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය සිදු කර අවසන් කර ඇති අතර එහි වාර්තාව කඩිනමින් ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 04. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 32 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 21 ක් වූ බැවින් පුරප්පාඩු 11 ක් පැවතුණි. | 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳව දක්වා ඇති තොරතුරු නිවැරදි වන අතර, ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව 32ක් වු අතර, තථ්‍ය සේවක සංඛ්‍යාව 21ක් වු බැවින් පුරප්පාඩු 11ක් පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |